# ප්‍රසම්පාදන දැන්වීමයි.

## සෞඛ්‍ය අමාත්‍යාංශය

## මහ රෝහල(ශික්ෂණ), පේරාදෙණිය

**පේරාදෙණිය මහ රෝහලේ විකිරණ අංශයට අයත් CT යන්ත්‍රය සඳහා UPS බැටරි 30ක් සැපයීම සහ ස්ථාපනය කිරීම**

01. සභාපති, ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුව,මහ රෝහල(ශික්ෂණ), පේරාදෙණිය විසින් **විකිරණ අංශයට අයත් CT යන්ත්‍රය සඳහා UPS බැටරි 30ක් සැපයීම සහ ස්ථාපනය කිරීම** සඳහා 2023 මැයි මස 15 වන දින සිට 2023 ජූනි 06 වන දින පෙ.ව 10.30 දක්වා මුද්‍රා තැබූ මිළ ගණන් කැඳවනු ලැබේ.

- ලංසු ලියවිලි නිකුත් කිරීම - 2023.06.15 දින සිට පේරාදෙණිය මහ රෝහලෙහි නිළ වෙබ් අඩවිය වන www.peradeniya-hospital.health.gov.lk වෙතින් බාගත කර ගැනීමෙන් හෝ සතියේ දිනයන්හි පෙ.ව.9.30 සිට ප.ව.2.30 දක්වා හා 2023.07.06 දින පෙ.ව.10.30 දක්වා රෝහල් කාර්යාලය මඟින් නිකුත් කරනු ලැබේ .
- ලංසු ලියවිලි භාරගන්නා අවසන් දිනය හා වේලාව - 2023.07.06 දින පෙ.ව.10.30
- ලංසු විවෘත කිරීම - 2023.07.06 දින පෙ.ව. 10.30

02. සියළුම ප්‍රසම්පාදන කටයුතු සඳහා ආපසු නොගෙවන ලංසු ලේඛණ ගාස්තු වශයෙන් රු. 2,500.00 ක මුදලක් පේරාදෙණිය මහ රෝහලේ සරප් අංශය වෙත ගෙවීමෙන් හෝ පේරාදෙණිය මහජන බැංකුවේ **ගිණුම් අංක 057100129025207** දරණ සෞඛ්‍ය ලේකම්ගේ ගිණුමට බැර කර ඊට අදාල ලදුපත ලංසු ලියවිලි සමඟ ඉදිරිපත් කල යුතුය.

03. පේරාදෙණිය මහ රෝහල් නිළ වෙබ් අඩවිය වන www.peradeniya-hospital.health.gov.lk වෙතින් බාගත කර නොගත් ලංසු ලේඛණ සහ ලංසු ලේඛණ ගාස්තු ගෙවන ලද ලදුපත ඉදිරිපත් කරනු නොලබන ලංසු ලේඛණ ප්‍රතික්ෂේප කරනු ලැබේ.

04. **පූර්ව ප්‍රසම්පාදන රැස්වීම -**
මෙම කාර්යයෙහි ප්‍රසම්පාදන කටයුතු සම්බන්ධයෙන් වන පූර්ව ප්‍රසම්පාදන රැස්වීම 2023.06.22 දින පෙ.ව.10.30ට පේරාදෙණිය මහ රෝහලේ සාකච්ඡා කාමරයේදී පැවැත්වේ.

| **අනු අංකය** | **ප්‍රසම්පාදන කාර්යය** | **ආපසු නොගෙවන ලංසු ගාස්තු** | **ලංසු ඇපකරයේ වටිනාකම** |
|---|---|---|---|
| 01. | **විකිරණ අංශයට අයත් CT යන්ත්‍රය සඳහා UPS බැටරි 30ක් සැපයීම සහ ස්ථාපනය කිරීම** | රු.2,500.00 | රු.60,000.00 (දින 90 වලංගු) |

05. නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ටෙන්ඩර්පත් "මුල්පිටපත" සහ "අනු පිටපත" වශයෙන් සලකුණු කර මුද්‍රා තබන ලද කවර දෙකක බහා ඉන්පසුව එම කවර දෙක එක කවරයක බහා මුද්‍රා තබා කවරයේ ඉහළ වම් කෙලවරේ " **විකිරණ අංශයට අයත් CT යන්ත්‍රය සඳහා UPS බැටරි 30ක් සැපයීම සහ ස්ථාපනය කිරීම** " ලෙස සඳහන් කර 2023.07.06 දින පෙ.ව. 10.30ට හෝ ඊට පෙර ලැබෙන සේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීමට හෝ අතින් ගෙනවිත් ගණකාධිකාරී කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීමට හෝ හැකිය.

06. ටෙන්ඩර්පත් සම්පූර්ණයෙන් පිළිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ප්‍රාදේශීය ප්‍රසම්පාදන මණ්ඩලය සතුවේ.

වෛද්‍ය,එච්.එම්.ඒ.තිලකරත්න,
අධ්‍යක්ෂ,
මහ රෝහල ( ශික්ෂණ),
පේරාදෙණිය.